2003 අංක 02 දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධිත) ප්‍රඥප්තිය

2000 අංක 2 හා 1990 අංක 2 දරන ප්‍රඥප්ති මගින් සංශෝධිත අංක 1989 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම පිණිස වූ ප්‍රඥප්තියකි

ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය 2003 අංක ...02.. දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධිත) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.	කෙටි නාමය
2. 1989 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ ප්‍රඥප්තියේ 02 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.	1989 අංක 01 දරන ප්‍රඥප්තියේ 2 වගන්තියට සංශෝධනය කිරීම
එම වගන්තියේ 2(අ) උප වගන්තිය ඉවත් කිරීමෙන් ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්	
(අ) i බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයාට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා, පළාත් අමාත්‍යවරයකුට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනාවලට සමාන විය යුතුය.	
ii සභාපති ධුරය හිස්ව පවත්නා අවස්ථාවක එම තනතුරෙහි නොකඩවා මාස 03කට වඩා වැඩි කාලසීමාවක් නියෝජ්‍ය සභාපතිවරයා විසින් වැඩ බලන්නේ නම්, සභාපති ධුරයෙහි වැඩ බලනු ලබන කාලසීමාව සඳහා සභාපති ධුරයට හිමි මාසික වැටුප් හා දීමනා නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතුය.	